**ඩුබායි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත**
**ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රයේ**
**සංස්කෘතික අධ්‍යාපන වැඩ පිළිවෙල සඳහා අයදුම් පත - 2016 – 2017**

| වායාරූපය මෙතන අලවන්න |
|---|

අමුණා ඇති නීති මාලාවේ සඳහන් අයැදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් කියවන්න.
ඇතුල් වීම සඳහා සුදුසුකම් ඇති දරුවන් සඳහා පහත සඳහන් ලේඛන අයදුම් පත්‍රයට අඩංගු කල යුතුය. අදාල ලේඛනය අමුණා ඊට අදාල කොටුව මත කතිරයක් යොදන්න.

- ☐ ගමන් බලපත්‍රය ප්‍රමාණයේ වායාරූපයක් ඉහල කොටුවේ අලවන්න.
- ☐ දරුවාගේ ගමන් බලපත්‍රයේ ( passport ) පිටු අංක 02 සහ VISA පිටුව වායා පිටපත්.
- ☐ දරුවාගේ හැඳුනුම් පතේ (Emirates Identity Card) වායා පිටපතක්.
- ☐ දරුවාගේ වයස 2016 අගෝස්තු මස 31 දිනට අවු 06 ට නො අඩු විය යුතුය. එසේ නොමැති නම් දිනපතා පාසලේ අවම වශයෙන් 01 ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන බවට එම පාසලෙන් ලබාගත් ලිපියක් / සහතිකයක්. වැඩි විස්තර සඳහා කොන්දේසි සහ නීති මාලාව කියවන්න.
- ☐ කොන්දේසි සහ නීති මාලාවට එකඟ බවට අත්සන් කරන ලද නීති මාලාවේ පිටපත් දෙකක් (2).

**ශිෂ්‍යයා / ශිෂ්‍යාව ගේ විස්තර**

1. සම්පූර්ණ නම (සිංහලෙන්) :..................................................................................................................

1.1. Full Name (in English):.......................................................................................................................

දහම් පාසල මගින් නිකුත් කරන සියලුම සහතික පත්‍ර සඳහා ඉහත සඳහන් නම භාවිතා කරනු ලැබේ. එබැවින් ගමන් බලපත්‍රයේ , උප්පැන්න සහතිකයේ හෝ එවැනි ලේඛනයන්හි සඳහන් ආකාරයටම නම සඳහන් කිරීම දෙමව්පියන්ගේ වගකීමක් බව සලකන්න.

2. උපන් දිනය : වසර.................. මාසය......................... දිනය.............

3. දැනට ඉගෙනුම ලබන පාසල : ................................................................. පන්තිය: .....................

4. දරුවාගේ සිංහල භාෂා දැනුම: ☐ හොඳයි ☐ සාමාන්‍යයයි ☐ දුර්වලයි

5. පදිංචි එමිරේටය:..........................................

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org

6. **මව / පියා / භාරකරු ගේ විස්තර:**

6.1 නම :.......................................................................................................................

6.2 ලිපිනය :.......................................................................................................................

6.3 දුරකථන අංක: අ) කාර්යාලය:............................................. ආ) නිවස: ...........................................

ඇ) ජංගම 1:................................................ ඈ) ජංගම 2:….......………….............

6.4 විද්‍යුත් තැපැල් ලිපිනය (Email) පුද්ගලික : ...................................................................................

6.5 විද්‍යුත් තැපැල් ලිපිනය (Email) රාජකාරි : ...................................................................................

6.6 ඔබගේ මෝටර් රථයේ /රථ වල වර්ගය සහ ලියාපදිංචි අංකයන්:

1. ලියාපදිංචි අංකය: .......................................... වර්ගය: ........................................

2. ලියාපදිංචි අංකය: .......................................... වර්ගය: ........................................

6.6 හදිසි අවස්ථාවක දැනුම් දීමට (දෙමාපියන් හැර ) වෙනත් අයෙකුගේ, (මේ බව ඔහුට/ඇයට කලින් දන්වා තිබීම දෙමාපියන් ගේ වගකීමක් බව සලකන්න)

නම:............................................................................... දුරකථන අංකයන්:.........................

ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය මගින් පනවා ඇති නීති රීති සහ කොන්දේසි මාලාවට කියවූ බවටත් ඊට එකඟ වන බව සහතික කරමි.

……………………………………………

මව / පියා / භාරකරුගේ අත්සන දිනය: ...........................................

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි. ඇතුල්වීමේ අංකය:.........................

සටහන් :…………………………………………. ඇතුලත් කල පන්තිය :....................

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org

**ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ පවත්වන සංස්කෘතික අධ්‍යාපන වැඩ පිළිවෙලට අදාළ කොන්දේසි මාලාව 2016-2017**

1.0 සිකුරාදා දිනවල පහත සඳහන් වෙලාවන් තුල පන්ති පැවැත්වෙනු ඇත.

- හතර (4) සිට අට (8) වසර දක්වා පන්ති - පෙ ව 8:00 සිට දහවල් 11:15 දක්වා
- දෙක (2) වසර සහ තුන (3) වසර පන්ති - දහවල් 11:45 සිට ප ව 3:00 දක්වා
- එක (1) වසර සඳහා පන්ති - ප ව 3:30 සිට සවස 6:25 දක්වා

2.0 ඉහත සඳහන් කාල වේලාවන් ට අනුකූලව දරුවන් රැගෙන ඒම සහ රැගෙන යාම දෙමාපිය භාරකරුවන්ගේ වගකීමකි. ප.ව. 6:30 න් පසු කොන්සල් ජනරාල් කාර්යාලය සහ එම පරිශ්‍රයේ ගැවසෙන දරුවන්ගේ සම්පූර්ණ වගකීම දෙමාපියන් සතුවනු ඇත.

3.0 දහම්පාසලට දරුවකු ඇතුළු කිරීමට අවම වශයෙන් පහත සඳහන් එක් සුදුසුකමක් හෝ තිබිය යුතුයි:

3.1 2016 අගෝස්තු මස 31 වැනිදාට වයස අවුරුදු හය (6) සම්පූර්ණ වී තිබීම, එනම් 2010 අගෝස්තු 31 දින හෝ එදිනට පෙර උපන් දරුවෙක් වීම

<u>හෝ</u>

3.2 දිනපතා පාසලේ එක (01) ශ්‍රේණියේ ඉගෙනුම ලබන <u>සහ</u> 2016 අගෝස්තු මස 31 වැනිදාට වයස අවුරුදු 5 සම්පූර්ණ කල දරුවෙකු වීම

4.0 දෙක (2) වසර සහ ඉන් ඉහල පන්ති වලට ඇතුලත් කිරීමට අවශ්‍යය දරුවන් සඳහා ලිඛිත සහ වාචික පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එයින් සමත්වන දරුවන් දහම් පාසලේ කමිටුවේ අනුමැතිය මත පමණක් ඉහල පන්තිවලට අනුගත කරනු ලැබේ. එම දරු දැරියන්ගේ වයස 2016 අගෝස්තු මස 31 වැනිදාට අවුරුදු හය (6) සම්පූර්ණ වී තිබිය යුතුය.

5.0 පිරිමි දරුවන් කොණ්ඩය කොටට කපා මනාව පීරා, සුදු පැහැති ජාතික ඇඳුමෙන් සැරසිය යුතු වන අතර අත් කොට කමිස හෝ අනෙකුත් ඇඳුමින් සැරසී නොපැමිණිය යුතුය. ගැහැණු දරුවන් පිට සහ කර ප්‍රදේශයන්, නාභිය සහ උදරය මනාව වැසෙන සේ සකසන ලද සුදු පැහැති වාම් ළමා සාරියකින් සැරසී, කොණ්ඩය කරල් දෙකකට වනසේ ගොතා සුදු පැහැති රිබන් පටි වලින් මනා ලෙස බැඳ පාසලට පැමිණිය යුතු වේ.

6.0 අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යෑම සඳහා දරුවන් දිනපතා පාසලට පැමිණීම අත්‍යාවශ්‍ය වනු ඇත. අධ්‍යයන වසර ඇතුලත පැවැත්වෙන දින ප්‍රමාණයෙන් 70% කට වැඩියෙන් ( දින 20 කට වැඩියෙන් ) සහභාගී වන දරු දැරියන් හට පමණක් වර්ෂ අවසාන පරීක්ෂණයට ඉදිරිපත් විය හැකි බවත්, ඒ අනුව ඉහල පන්තියට අනුගත කිරීම සිදු කෙරන බවද කරුණාවෙන් සලකන්න.

7.0 දැනුම් දීමකින් තොරව නොකඩවා දින තුනක් පාසලට නොපැමිණෙන දරුවන් පාසල හැර ගියාසේ සලකනු ඇත. එම දරුවන් නැවත පාසලට ඇතුලත් කරවීමට අවශ්‍ය නම් මීළඟ පාසල් වාරයේදී අලුත් ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතුය.

8.0 පාසල නොපවෙත්වන දින, විශේෂ අවස්ථාවන් පිළිබඳව සහ වෙනත් පුහුණු කිරීම් කටයුතු පිළිබඳව පූර්ණ දැනුම් දීමක් දෙමාපියන් වෙත කෙරෙනු ඇත. එවන් හදිසි අවස්ථාවන් පිළිබඳව දැනුම් දීම සඳහා ඉල්ලුම් පත්‍රයේ සඳහන් දුරකථන අංක, අන්තර්ජාල ලිපිනයන් ආදිය වෙනස් වන්නේ නම් නොපමාව ඒ පිළිබඳව දැනුම් දීම දෙමාපියන්ගේ වගකීම වනු ඇත.

9.0 දූ දරුවන් වෙලාවට රැගෙන ඒම, රැගෙන යාම සහ වැඩ සටහන් පැවැත්වෙන වේලාවන් තුලදී කොන්සල් ජනරාල් කාර්යාල පරිශ්‍රය තුල හෝ ඒ අවට අනවශ්‍ය ලෙස ගැවසීම සහ රැස්වීම් පැවැත්වීමෙන් වැළකිය යුතුය.

10.0 කොන්සල් ජනරාල් කාර්යාලය අසල තම වාහන නවත්වීමේදී අවට නිවැසියන් හට අවහිර නොවන අයුරින් කටයුතු කල යුතුය. දරුවන් වාහනයෙන් බැස්වීම හෝ නැංවීම සඳහා කොන්සල් ජෙනරාල් කාර්යාලය ඉදිරිපිට හෝ නවතා ඇති වාහන අසල හෝ මාර්ගය අවහිර වනසේ වාහන නවත්වන අවස්ථාවන් හිදී ඒ පිළිබඳව ක්‍රියා කිරීමට අදාළ නිලධාරින් හට දැනුම් දී නීතිමය පියවර ගැනීමට සිදුවනු ඇත. දරුවන් ආරක්ෂා සහිතවත් සැකසුරුවම් සහිතවත් වාහනයට ගොඩ නැංවීම සහ ගොඩ බැස්වීම දෙමව්පියන්ගේ පූර්ණ වගකීමක් වනු ඇත.

11.0 දූ දරුවන්ට අවශ්‍ය පරිදි විවේක කාලයේදී අනුභවය සඳහා නිර්මාංශ සුළු ආහාරයක් සහ බීමක් සුදුසු ලෙස පාර්සල් කොට එවීම දෙමව්පියන් ගේ වගකීමක් වනු ඇත. එම පාර්සල් වල අනිවාර්යයෙන් දරුවාගේ නම සඳහන් කල යුතුය.

12.0 සිකුරාදා දිනවල දහම් පාසල අසල සිසුන් හැසිරවීම, වාහන හැසිරවීම ආදියෙහි වගකීම දෙමාපිය කමිටුව සතු වන අතර තම වාහනය නිසි ලෙස නවතා දරුවන් රැගෙන ඒම / යාම සිදුකරමින් එම කටයුතු සඳහා දෙමාපියන්ගේ සම්පූර්ණ සහයෝගය ලබා දිය යුතුය. ද්විත්ව නවතන (double parking), ප්‍රධාන දොරටුව ඉදිරිපස නැවතීම, දරුවා එනතෙක් පාරේ අනෙක් පස වාහනය නවතා ගෙන සිටීමෙන් සපුරා වැළකිය යුතුයි.

13.0 දහම් පාසල මගින් පවත්වන විවිධ වැඩසටහන් වලට සහභාගී වන දූ දරුවන් ගේ ඡායාරූප, වීඩියෝ පට සහ හඬ පට විවිධ මාධ්‍යයන් ඔස්සේ දහම් පාසල මගින් ප්‍රචාරය කිරීම පිළිබඳව කිසියම් විරෝධයක් නොමැති විය යුතුයි.

14.0 දරුවාගේ සෞඛ්‍ය හෝ හැසිරීම් රටාව සම්බන්ධයෙන් දහම් පාසල දැනගතයුතු විශේෂ කරුණු (ආසාත්මිකතා - allergies, ආබාධිත තත්වයන් - special needs) වෙතොත් එය අදාල ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා සංවිධායක කමිටුව වෙත දැනුම්දිය යුතුයි.

15.0 දෙමව්පියන් දහම් පාසලට දරුවන් රැගෙන එන විට සුදුසු වාම් ඇඳුමකින් සැරසී පැමිණිය යුතුයි. සුදු පැහැති ඇඳුමකින් සැරසී දහම් පාසලට පැමිණීම වඩාත් සුදුසු බව සලකන්න

16.0 හැකිතාක් දුරට නිතර භාවිතා කරන <u>පුද්ගලික</u> විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනයක් ලබාදීමට කටයුතුකළ යුතුය. මෙම ලිපිනයන් වෙත පණිවිඩ එවීම දහම් පාසලේ කමිටුවේ අධීක්ෂණය යටතේ සිදුකරන බව සලකන්න.

17.0 මෙම කොන්දේසි මාලාව විටින් විට වෙනස් කෙරෙන අතර ඒ පිළිබඳව දෙමාපියන් දැනුවත් කරනු ඇත.

සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය මගින් පනවා ඇති කොන්දේසි මාලාවට එකඟ වන බවටත් දහම් පාසැලේ දූ දරුවන් සහ දෙමාපියන් සඳහා පනවා ඇති විනය නීති මාලාව පිළිපදින බවටත් සහතික කරමු.

මව / පියා / භාරකරු ගේ නම: ....................................................................................................

අත්සන:............................................................... දිනය:..........................................